**තාක්ෂණික ආයතනය - මොරටුව විශ්වවිද්‍යාලය - 2017**

**-----------------------------------------------------------**

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 2000 අංක 03 දරන මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතන නියමාවලියේ 20 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ III වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට තාක්ෂණික ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

(i) ප්‍රමිතයේ 09 ඡේදය අනුව "ආයෝජනයක් මුදල් හා මුදල් සමාන දෑ ලෙස සුදුසුකම් ලබනුයේ, එය අත්පත් කරගත් දිනයේ සිට මාස තුනක් හෝ ඊට අඩු කෙටි කල්පිරීම් කාලයක් පවතින අවස්ථාවලදී පමණක් වුවද 2017 දෙසැම්බර් 31 දිනට රු.19,082,110 ක් වූ දිගුකාලීන ආයෝජන ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් හා මුදල් සමාන දෑ තුළ ඇතුළත් කර තිබුණි. මෙම ක්‍රමවේදයම පූර්ව වර්ෂයේදීද අනුගමනය කර තිබුණ අතර එය සමාලෝචිත වර්ෂය තුළ නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු දෑ හි වැඩවීම රු.6,906,266 ක් වුවත් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.6,930,751 ක වැඩිවීමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.834,485 ක වෙනසක් නිරීක්ෂණය විය.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

ප්‍රමිතයේ 65 වන වගන්තිය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.19,046,962 ක් වූ දේපළ පිරියත හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට අදාළ මහපොළ හා ශිෂ්‍යාධාර වියදම පිළිවෙලින් රු.4,150,150 ක් හා රු.18,640,900 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එම වියදම පිළිවෙලින් රු.4,910,000 ක් හා රු.17,897,100 ක් ලෙස දැක්වීම හේතුවෙන් මහපොළ රු.759,850 ක් වැඩියෙන් හා ශිෂ්‍යාධාර රු.743,800 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ) 2017 නොවැම්බර් 30 දින කාර්යාල, විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ රු.14,427,810 කට හා ලී බඩු රු.643,705 කට ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර නව ප්‍රත්‍යාගණන අගයයන් මත 2017 දෙසැම්බර් 31 දිනට රු.245,828 ක් වූ ක්ෂය , ක්ෂය ගිණුමෙන් ඉවත් කර ප්‍රත්‍යාගණන ගැලපුම් ගිණුමට හර කර තිබුණි. ඒ අනුව එම වත්කම්වලට අදාල ක්ෂය වටිනාකම හා ප්‍රත්‍යාගණන සංචිතය රු.245,825 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) කාර්යාල , විද්‍යාගාර, ඉගැන්වීම් උපකරණ සහ ලී බඩු යන වත්කම් ඉවත් කිරීමේ අලාභය වූ රු.1,251,448 මෙහෙයුම් වියදමක් ලෙස ලාභයෙන් අඩුකර දැක්විය යුතු වුවද එම අලාභය ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට ගලපා තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් නිරූපණය වී තිබුණු අතර වර්ෂාවසාන ප්‍රාග්ධන ප්‍රදාන ශේෂයද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ආයතනයේ ව්‍යාපෘති භූමියේ විදුලි සැපයුම වෙනුවෙන් වැයකර තිබූ රු1.,407, 000 ක් ගොඩනැගිලි වටිනාකමට ප්‍රාග්ධනීත කිරීම වෙනුවට පුනරාවර්තන වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි .

(ඉ) දියගම තාක්ෂණික ආයතනයේ ප්‍රතිස්ථාපන සහ සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් 2017 වර්ෂය තුළ දරා තිබුණු රු.10,360,051 ක වියදම,කෙරීගෙන යන වැඩ යටතේ දැක්වීම වෙනුවට වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබුණි.

### 2.2.3 ආයතනය විසින් හා ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

---

ආයතනය විසින් බාහිර ආයතනයකට විරුද්ධව රු.මිලියන 05 ක වන්දි ඉල්ලා මොරටුව දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් පවරා ඇති අතර එම නඩුවේ විත්ති පාර්ශවය විසින් එම නඩුව සම්බන්ධව මහාධිකරණයට ඇපෑලක් ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ අංක 45 (2) (1) (XV) ප්‍රකාරව විශ්වවිද්‍යාලයට අයත් කවර මුදලක් වුවද නීත්‍යානුකූලව ආයෝජනය කළ හැකි යම් සුරැකුම්පතක ආයෝජනය කිරීම හෝ කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන යම් බැංකුවක ස්ථිර තැන්පත් මුදලක් ලෙස තැන්පත් කළ යුතු බව දක්වා තිබුණද දුරස්ථ අධ්‍යාපන නවීකරණ වැඩසටහන (Distance Education Modernization Programme) වෙනුවෙන් 2009 වර්ෂයේදී වෙන්කරන ලද රු.955,030 ක මුදලක් කිසිඳු ආයෝජන කටයුත්තකට යොදා ගැනීමකින් තොරව තාක්ෂණික ආයතනයේ ජංගම ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බැර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.42,448,648 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,494,368 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 44,943,016 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රජයේ ප්‍රදාන රු.16,254,000 කින් වැඩිවී තිබුණද ඊට සාපේක්ෂව පුනරාවර්තන වියදම් රු.69,767,960 කින් වැඩිවීම ඉහත පිරිහීමට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.3,510,686 ක් වූ ඌනතාවය තව දුරටත් පිරිහී 2017 වර්ෂයේදී රු.42,448,648 ක් බවට පත්වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා දේපල පිරියත හා උපකරණ සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී රු.60,521,335 ක් වූ ආයතනයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.104,481,868 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය තුළ පවත්වන ලද ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ දෙවන වසර විභාග ප්‍රතිඵල මත අධ්‍යයන අංශ 09 ක සිසුන්ගේ සමත්වීමේ සාමාන්‍ය ප්‍රතිශතය සියයට 83 ක් වුවද, Electronic, Marine, Polymer , Civil , Mechanical සහ Textile යන අංශවල සමත්වීමේ ප්‍රතිශතය පිළිවෙලින් 65,72,76,76,78 සහ 79 ක් විය. ඒ අනුව එම අංශවල විභාග ප්‍රතිඵල අපේක්ෂිත මට්ටම කරා ළඟා වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ජාතික තාක්ෂණික ඩිප්ලෝමාවට නව පාඨමාලා හඳුන්වා දීමට සැලසුම් සකස් කර තිබුණද 2018 අගෝස්තු 09 දින වනවිටත් එම පාඨමාලාවන් සඳහා සිසුන් බඳවාගෙන නොතිබුණි.

(ඇ) 2015, 2016 සහ 2017 වර්ෂයන්හිදී ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම සඳහා පිළිවෙලින් රු.100,000 ක්, රු.100,000 ක් සහ රු.1,000,000 ක් බැගින් වූ ප්‍රතිපාදන වෙන් කර තිබුණද එයින් කිසිඳු මුදලක් වැයකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී ආයතනය සඳහා කාර්යක්ෂම හා ඵලදායී කළමනාකරණ තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් එම කටයුතු ආරම්භ කර නොතිබුණි.

**4.2** **අරමුදල් ඌන උපයෝජනය**

2017 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. 9,096,878 ක් වූ අරමුදල් 06 ක් එම අරමුදල් ස්ථාපිත කළ දින සිට වසර 09 සිට 14 ක් දක්වා කාලයක සිට කිසිඳු කාර්යයක් සඳහා යොදා ගැනීමකින් තොරව අක්‍රීයව පැවතුණි.

**4.3** **කාර්ය මණ්ඩල පරිපාලනය**

අනුමත අධ්‍යයන කාර්යමණ්ඩලය 111 ක් වූ අතර තත්‍ය කාර්යමණ්ඩලය 38 ක් වූයෙන් පුරප්පාඩු 73 ක් විය. එම පුරප්පාඩු පිරවීම සඳහා බාහිර තාවකාලික හා වැඩ පැවරුම් පදනම මත 45 දෙනෙකු බඳවා ගෙන තිබුණද තවදුරටත් තනතුරු 28 ක් පුරප්පාඩුව පැවතුණි. අනුමත අනධ්‍යයන කාර්යමණ්ඩලය 156 ක් වූ අතර තත්‍ය කාර්යමණ්ඩලය 76 ක් වූයෙන් පුරප්පාඩු 80 ක් විය. එම පුරප්පාඩු පිරවීම සඳහා බාහිර, තාවකාලික හා වැඩ පැවරුම් පදනම මත 20 දෙනෙකු බඳවා ගෙන තිබුණද තවදුරටත් තනතුරු 60 ක් පුරප්පාඩුව පැවතුණි.

**5.** **තිරසාර සංවර්ධනය**

**5.1** **තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු අතර සමාලෝචිත වර්ෂයට අදාලව විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

**6.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**6.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත අදාල වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 02 දින ඉදිරිපත් කර තිබුණි.

**7.** **පද්ධති හා පාලනයන්**

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව කටයුතු නොකිරීම. |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර නොතිබීම. |
| (ඇ) | අරමුදල් කළමනාකරණය | අරමුදල් ඇති කිරීමේ අරමුණු ඉටු කර ගැනීමට ක්‍රියා නොකිරීම. |
| (ඈ) | කාර්යමණ්ඩල පරිපාලනය | පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුනොකිරීම. |